# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1793/18 – 2013 ජනවාරි 17 වැනි බ්‍රහස්පතින්දා – 2013.01.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: මීග/3/අත්/155.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බසියාවත්ත ගමේ (මීගමුව මහනගර සභා සීමාව තුළ උප කොට්ඨාසය) පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවට ගම්පහ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක ගම් 3888 පිඹුරේ කැබලි අංක 1, 2, 3 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0133ක් වූ පහත විස්තර කරන ලද ඉඩම් කැබලි තුන (3):

කැබලි අංක 1
ඉඩමේ නම: කඩොල්ගහවත්ත, තලාහේන පාරේ වරි. අංක 30හි කොටසක්; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: එම්. රේමන් ප්‍රනාන්දු, බසියාවත්ත, තලාහේන, මීගමුව; ප්‍රමාණය: හෙක්. 0.0021.

කැබලි අංක 2
ඉඩමේ නම: කඩොල්ගහවත්ත, තලාහේන පාරේ වරි. අංක 35හි කොටසක්; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: ජෝශප් කැෂියස් ප්‍රනාන්දු, බසියාවත්ත, තලාහේන, මීගමුව; ප්‍රමාණය: හෙක්. 0.0107.

කැබලි අංක 3
ඉඩමේ නම: කඩොල්ගහවත්ත, තලාහේන පාරේ වරි. අංක 30 ඒ හි කොටසක්; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: ඩේවිඩ් ප්‍රනාන්දු, බසියාවත්ත, තලාහේන, මීගමුව; ප්‍රමාණය: හෙක්. 0.0005.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 මාර්තු මස 21 වැනි දින පෙ.ව. 10.30 ට මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2013 මාර්තු මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඒ. කේ. ආර්. අලවත්ත,
ප්‍රාදේශීය ලේකම්,
මීගමුව.

2013 ජනවාරි මස 16 වැනි දින,
මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 – 116